# සඳැස් කවියට අත්වැලක්

සත්වැනි කොටස



ආචාර්ය
ඥානතිලක හේවාගමගේ

මෙම ඡන්දස් දෙකට අයත් අලංකාර විරිත් රාශියක් දක්නට ලැබේ. ඉන් කිහිපයක් පිළිබඳව විස්තර පහත දැක්වේ.

**සෙල් ඡන්දසට අයත් විරිත්:**
මෙම ඡන්දසට අයත් කවියක පාදයක මාත්‍රා දහතුනක් හෝ දහහතරක් තිබිය හැක. ගණ පිහිටුවීම අනුව හෝ විරාම ස්ථාන වෙනස්වීම අනුව හෝ මෙම ඡන්දසට අයත් විවිධ විරිත් හට ගැනේ.

**නළුගාහ විරිත:**
යම් විරිතක්, පාදයක මාත්‍රා සතරකින් පසුව ගුරක් ද ඉන් අනතුරුව විරාමය ද, නැවත මාත්‍රා සතරකින් පසුව ගුරු දෙකක් ද ඉන් අනතුරුව විරාමය ද කොට පබැඳුව හොත් එය නළුගාහ විරිත නම් වේ. තිසර සංදේශයේ එන පහත දැක්වෙන කවිය නළුගාහ විරිත සඳහා කදිම නිදසුනකි.

පිපි සපු නා තුරු පඳුරාහා
වග ලගනා ගිරි කඳුරාහා
ඇත සරනා සඳකිඳුරාහා
බල තොසිනා හැම ඉඳුරාහා

එලෙසම පහත දැක්වෙන්නේ නළුගාහ විරිතට තවත් උදාහරණයක් ය.

හදක සෙනේ අහිමි වෙලාවේ
කඳුළු ගලා දෙනෙත රැදාවේ
දුකම දැනේ කෙලෙස සිනාවේ
සැනසි දිනේ මෙලෙස නිමාවේ

**මිණි පොකුරු විරිත:**
යම් විරිතක්, පාදයක 'න' ගණ සතරකින් පසු ගුරක් ලා බැඳ මාත්‍රා සතකින්, සතකින් විරාම ස්ථාන තැබුව හොත් එය මිණි පොකුරු විරිත නම් වේ. පහත දැක්වෙන්නේ

## සෙල් ඡන්දසට සහ ගජ ඡන්දසට අයත් විරිත්

සිංහල සඳැස් කවි සම්මේලනයේ පස්වැනි වාර්ෂික සමරු කලාපයේ එන ''ඉකිබින්ද මධු සමය" නම් කවි පංතියෙන් උපුටාගත් කවියකි. මෙය මිණි පොකුරු විරිතට අනුව පද බැඳ ඇත.

කවක විරිතක දිලෙන සිරිනා
බැඳුණි ගත සිත සුවය දෙමිනා
පිරුවටයෙ සුද රැකුණු පවිනා
පැතුව සුරලොව දෙදර වැටුණා

එලෙසම මිණි පොකුරු විරිතට තවත් සරල උදාහරණයක් පහත දැක්වේ.

දවන දහවල නැගුන විටදී
පවන හමනව රුදුරු හඬදී
කවර කරුමෙද නොදන පළදී
සියලු හිමි දෙය දැවෙය දුකදී

**කනීල් විරිත:**
යම් විරිතක්, පාදයක මාත්‍රා පසකින් පසුව 'බ' ගණය සහ 'ය' ගණය වුවහොත් සහ මාත්‍රා සතකින්, සතකින් විරාමය තැබුවහොත් එය කනීල් විරිත නම් වේ. එළු සඳැස් ලකුණ පොතෙහි එන කවියක් මෙම විරිතට නිදසුනක් ලෙස දැක්විය හැක.

සලා සිකි පිල් මලග ලැග්ගේ
සඳද අත් ගල් තෙලෙහි ලැග්ගේ
මහද තුළ මන් යොන ද ලැග්ගේ
කිමෙක උන් මා දෙස නො ලැග්ගේ
එලෙසම කනීල් විරිතට සරල උදාහරණයක් පහතින් දැක්වේ.

අතට වෙරළුත් ඇහිඳ ගත්තේ
පලා මිටකුත් නෙළල ඇත්තේ
දර මිටියකුත් සිරස මත්තේ
අම්ම එනවා පහළ වත්තේ

**මිණිමල් විරිත:**
යම් විරිතක්, පාදයක මාත්‍රා දහහතරකින් යුක්තව සහ මාත්‍රා අටකින් ද නැවත සයකින් ද විරාමය තබා බඳින ලද නම් එය මිණිමල් විරිත නම් වේ. ගුරු ලඝු භේදයක් නොමැති නමුත් පාද මැද විරාමය පිහිටුම හේතුවෙන් මෙහි අටවැනි සහ නමවැනි මාත්‍රා එකතුවී ගුරක් සෑදිය නොහැක. සී. ටී. ප්‍රනාන්දු ගායකයා ගැයූ ගීතයක පහත සඳහන් ගීත ඛන්ඩය මෙම විරිතට උදාහරණයක් ලෙස දැක්විය හැක.

පියුමෙහි පැණි බොති වන බඹරූ
මල මත නොරඳති කළු දෙබරූ
දහවල් නොදිලෙයි අඹරෙ තරූ
අවරින් නොනැගෙයි නැගෙන හිරූ

මිණිමල් විරිතට තවත් උදාහරණයක් පහත දැක්වේ.

යලට මහට නිසි වැසි ලැබිලා
අටුව කොටුව සැම විට පිරිලා
සිතුව පැතුව දෙය නිති ලැබිලා
සැපත සතුට විඳ ගනු නුඹලා

**ගජ ඡන්දසට අයත් විරිත්:**
මෙම ඡන්දසට අයත් විරිත්වල පාදයක මාත්‍රා පසළොසක් හෝ දහසයක් තිබිය හැක. ගණ පිහිටුවා ඇති ආකාරය අනුව හෝ විරාම ස්ථාන පිහිටන අකාරය අනුව මෙම ඡන්දසට අදාලව විවිධ විරිත් නිර්මාණය වේ.

**සදුල් කෙළි විරිත:**
මාත්‍රා දහයකින් ද නැවත මාත්‍රා පහකින් ද විරාමය තබා පාදයක් මාත්‍රා පසළොසකින් බැන්ද හොත් එය සදුල් කෙළි විරිත නම් වේ. මෙහි ගුරු ලඝු භේදයක් නැති නමුත් පාද මධ්‍යයේ ඇති විරාම ස්ථානය නිසා දසවැනි සහ එකළොස්වැනි මාත්‍රා එකතුවී ගුරක් සෑදිය නොහැක. පහත දැක්වෙන්නේ සදුල් කෙළි විරිතට සරල උදාහරණයකි.

සුන්දරයි පිපි කුසුම අතු අගට
මන්දිරයි දිලිසෙන්නෙ මග දිගට
සංවරයි වෙසෙන දන සැම කලට
පෙම්බරයි දකින අය මෙම ගමට

**දියකේලි විරිත:**
පාදයක් ලඝු සයකින් පසුව 'ද' ගණයක් ද 'න' ගණයක් ද සහ ගුරකින් ද යුතුව බඳිනා ලද්දේ නම් එය දියකේලි විරිත නම් වේ. මාත්‍රා නමයකින් මධ්‍ය විරාමය පිහිටයි. සිංහල සඳැස් කවි සම්මේලනයේ පස්වැනි වාර්ෂික සමරු කලාපයේ එන "තහංචිය"

